www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා මහ බැංකුව ගැඹුරුවන ආර්ථික ප්‍රතිවිරෝධතා වසන් කිරීමට උත්සාහ කරයි

## Sri Lankan Central Bank attempts to cover up deepening economic contradictions

**සමන් ගුනදාස විසිනි**

**2006 මැයි 19**

මැයි 01 දා නිකුත් කරන ලද *ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව 2005* මගින් රටේ ආර්ථිකය සහ ආන්ඩුවේ පිලිවෙත් පිලිබඳව සතුටුදායක චිත්‍රයක් ඉදිරිපත් කෙරින. ගිය වසරේ ආර්ථික වර්ධන වේගය " අපේක්ෂාවන් ඉක්මවමින්" සියයට 6ක් වූ බැව් අවධාරනය කරන එය, 2006 සහ ඉන් ඔබ්බට මීටත් වැඩි වර්ධන වේගයක් සඳහා වූ ආන්ඩුවේ අනාවැකිවලට පිටුබලය ලබා දේ. වාර්තාවට අනුව උද්ධමනය පහල වැටුනු අතර ගෙවුම් ශේෂය අතිරික්තයක් විය.

මෙම ශුභවාදී අදහස විවේචනාත්මක විමර්ශනයකින් පැන නොනගී. වාර්තාව මගින් ඉදිරිපත් කෙරෙන සංඛ්‍යා ලේඛනමත් සැකසහිත වන අතර, එපමනක් නොව, ඉහල නගින තෙල් මිල, දවැන්ත නය කන්දරාව සහ නව සිවිල් යුද්ධයේ අනතුර හේතු කොට ගෙන ආර්ථිකය පීඩා විඳිමින් පවතී. සුවිශේෂිතවම තම ජීවන කොන්දේසි නොකඩවා පිරිහෙමින් පවත්නා සාමාන්‍ය මහ ජනතාවට සමස්ත ආර්ථික දර්පනය නීරසය.

දිවයිනේ මුහුදු තීරයෙන් වැඩිමනත් කොටසක නිවාස, පාසැල් සහ යටිතල පහසුකම් විනාශ කෙරුනු 2004 දෙසැම්බරයේ සුනාමි රල පහරෙන් සිදු වූ ව්‍යසනයෙන් පසු සිදු කෙරුනු ප්‍රතිසංස්කරන ක්‍රියාකාරකම් ද "වර්ධන සංඛ්‍යා ලේඛනවලට අන්තර්ගත විය. ධීවර සහ සංචාරක කර්මාන්තයට හානි පැමිනුනු තත්වයක් තුල, සීමිත පශ්චාත් සුනාමි නැවත ඉදිකිරීම් මගින් ආර්ථික වර්ධනයට තල්ලුවක් දී ඇත. තව දුරටත්, ජාත්‍යන්තර ආධාර ගලනය ගෙවුම් ශේෂ අතිරික්තය සඳහා සැලකිය යුතු සාධකයක් විය.

සන්ඩේ ටයිම්ස් විචාරකයෙකු මෙසේ සටහන් කලේ යඃ "යමෙකු මහ බැංකුවේ වාර්ෂික වාර්තාව පේලි අතර කියවමින් එය තුල අඩංගු සවිස්තරාත්මක දත්තයන් විමර්ශනය කල හොත් පැහැදිලි වන්නේ ආර්ථිකය හොඳින් ක්‍රියාත්මක වී ඇති බවයි. නැත හොත් සුනාමියේ පිහිටෙන් එය හොඳින් ක්‍රියාත්මක වී ඇති බව ය. පරස්පරවිරෝධීව හා උත්ප්‍රාසාත්මකව, සුනාමිය රටේ ගැලවුම්කරු ලෙසට නොපැමිනියේ නම් ආර්ථික අර්බුද කීපයකට මුහුන දිය හැකිව තිබින. මේවා සුවිශේෂිතව බාහිර මූල්‍ය සැපයීම් හා මූල්‍ය අසමතුලිතතාවන්ට සම්බන්ධිතය.

ජාත්‍යන්තර සුනාමි ආධාර ආන්ඩුවේ මූල්‍යයන්ට සහාය වූ අතර ව්‍යාපාරික ක්‍රියාකාරකම් වර්ධනය කිරීමට තුඩු දුනි. එනමුදු තම නිවාස සන්තක දෑ ජීවනෝපායන් හා ආදරය කලවුන් අහිමිව ගිය දසදහස් සංඛ්‍යාත දුගීන්ට එමගින් ලැබුනු සහාය අල්ප ය. බොහොමයක් දෙනා මෙතෙකුදු තාවකාලික නිවාසයන්හි, ආන්ඩුවෙන් ලැබෙන සොච්චම් ආධාරයකින්, රැකියාවක් පිලිබඳ බලාපොරොත්තුවකින් තොරව ජීවත් වෙති.

මහ බැංකු වාර්තාවට අනුව ආර්ථික වර්ධනයෙන් හරි අඩකටත් වැඩි ප්‍රමානයකට දායක වී ඇත්තේ කෘෂිකාර්මික හෝ කර්මාන්ත අංශය නොව සේවා අංශය යි. තරමක් විකාර සහගතව වාර්තාවේ කතුවරුන් කියා සිටින්නේ, "ආහාර, නිවාස සහ අනෙකුත් භෞතික භාන්ඩ සඳහා කුඩා ප්‍රමානයක්" වැය කරමින්, "ජීවිතය වඩාත් වින්දනාත්මක බවට පත් කිරීමට අවශ්‍ය" සේවාවන් සඳහා වඩාත් කැපවීම රටට අවශ්‍ය කෙරී ඇති බැව් එමගින් සංකේතවත් කෙරී ඇති බවයි.

වැඩිමනත් ජනයා තම සියලු ඉපැයීම් එදිනෙදා දිවි ගැට ගසා ගැනීමට වැය කරති. මාසික වැටුපේ සාමාන්‍යය රුපියල් 6,000ක් හෝ ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් 60ක් වන අතර මුලු වැටුපම ආහාර, නවාතැන්, ඇඳුම්, ප්‍රවාහනය සහ අනෙකුත් අත්‍යාවශ්‍ය දෑ සඳහා වැය කෙරේ. වාර්තාවම පෙන්වා දෙන පරිදි ජනගහනයෙන් පහෙන් එකකටත් වැඩි ප්‍රමානයක්, එනම් සියයට 22.7ක් මාසික ආදායම වන රුපියල් 1,423 ක් වූ දරිද්‍රතා රේඛාවෙන් පහල ජීවත්වෙති. දස ලක්ෂ දෙකක් වූ ජනයා යන්තම් දිවි ගැට ගසා ගැනීමට සෑහෙන සීමිත ශුභසාධන දීමනාවක් වන සමෘද්ධිය මත යැපෙති.

මෙකී සේවාවන්හි වර්ධනය මගින් කම්කරු ජනයාගේ ජීවිත "වඩාත් වින්දනාත්මක" කෙරී නැත. මූල්‍ය සහ බැංකු කටයුතු වැනි වානිජ ක්ෂේත්‍රයන්හි ද ආන්ඩුවේ සේවාවන්හි ද වැඩිවන ක්‍රියාකාරිත්වය මගින්

එය වඩාත් පිලිබිඹු වේ. මෙම වර්ධනයේ එක් කොටසක් සුනාමියට ගොදුරුවූවන්ට සලසන සේවාවන් වියහැකි ය. තවෙකක් වූයේ විරැකියාව අඩු කිරීම සඳහා ගත් වියරු සහගත උත්සාහයක දී උපාධිධාරීන් 42,000ක් බඳවා ගැනීමට ආන්ඩුව ගත් තීන්දුව ය.

වඩාත් අනතුරු ඇඟවුම් සහගතව, සේවාවන්හි ප්‍රසාරනයට මිලිටරි වියදම් ද අන්තර්ගත වේ. මෙය බලයට පැමිනි සෑම ආන්ඩුවක් විසින් ම, සුවිශේෂිතව පසු ගිය නොවැම්බරයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ බලයට පැමිනීමත් සමග ම, ඉහල නංවනු ලැබින. දෙසැම්බරයේ දී නිවේදනය කල ඔහුගේ සුවිශේෂී " දුගී හිතකාමී" අය වැයෙන් මිලිටරි සහ පොලිස් වියදම් සියයට 26ක දැවැන්ත අගයකින්, එනම් රුපියල් බිලියන 76 සිට රුපියල් බිලියන 96 දක්වා ඉහල නැංවින. රාජපක්ෂ මෙම "සේවාවෙන්" රට නැවත විනාශකාරී සිවිල් යුද්ධයකට ඇද දැමීම සඳහා යොදා ගැනීමට සූදානම් වේ.

විවෘත ගැටුමේ අන්තරාය සහ ආර්ථිකය කෙරෙහි එහි අනිවාර්ය බලපෑම සම්බන්ධයෙන් වාර්තාවට පැවසීමට ඇත්තේ අල්පයකි. කෙසේ නමුදු, එවන් යුද්ධයක් විදේශ ආයෝජනයේ බිඳ වැටීමකට ද, දැවැන්ත රාජ්‍ය වියදම් වැඩිවීමකට ද, ගෙවුම් ශේෂ අර්බුදයකට ද තුඩු දිය හැකි බවට මූල්‍යමය කවයන් තුල පවත්නේ යථා භීතියකි. අප්‍රේල් අගදී, කොලඹ හමුදා මූලස්ථානයට මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය එල්ල කිරීමෙන් පසුව, "මෑත දී තියුනු ලෙස වර්ධනය වූ එදිරිවාදිකම්" පිලිබඳව සිය කනස්සල්ල පල කරමින් ස්ටෑන්ඩර්ඩ් සහ පුවර්ස් ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ආර්ථික දර්ශකය ස්ථාවර තත්වයේ සිට සෘන පැත්තට ගමන් කරමින් සිටින බව ප්‍රකාශ කරමින් අව ශ්‍රේනිගත කෙරින.

සන්ඩේ ටයිම්ස් පුවත්පතේ ආර්ථික විශ්ලේෂනයෙන් මෙසේ අනතුරු ඇඟැවී යː "දැන් වෙන කවරදාටත් වඩා විවෘත යුද්ධය ආසන්න වී ඇත. එය සිදු වුන්, නො වූවත් එසේ සූදානම් වීමේ අදහස වන්නේ ආනයනය සඳහා ඉහල වියදමක් අන්තර්ගත කර ගත් දැවැන්ත මිලිටරි වියදමක් දැරීමට සිදුවන බවයි.... මෙම අමතර වියදම එක්සත් ජනපද ඩොලර් මිලියන 1000 ඉක්මවා ගිය හොත් -- එය එසේ වීමට බොහෝ ඉඩකඩ ඇත -- එය ගෙවුම් ශේෂ පරතරය මත ඉසිලිය නොහැකි බරක් වනු ඇත. එවිට, නිසැකවම, නය මගින් සහ කල්තබන ලද ගෙවුම් ගිවිසුම් මගින් මුදල් සොයා ගත යුතු වේ. මෙහි අදහස වන්නේ අනාගත සංවර්ධන වියදම් සොයාගත නොහැකි තරමට වූ බිහිසුනු අනුපාතයන්ගෙන් විදේශ නය ප්‍රමානය ඉහල නගිනු ඇති බවයි. අතිරේක මූල්‍ය හිඟයන් මගින් ජනනය කෙරෙන උද්ධමනීය පීඩනයන් හරහා ආර්ථිකය අස්ථාවර කරනු ඇත."

## ආර්ථික භංගුරතාව

මහ බැංකුවේ අතිශයෝක්තියට නංවනු ලැබූ චිත්‍රය තිබිය දී, පසු ගිය වසරේ ආර්ථික දර්ශක මගින් පෙන්නුම් කරන්නේ ආර්ථිකය සෞඛ්‍ය සම්පන්න නොවන බවයි. ගෙවුම් ශේෂය අතිරික්ත විය හැකි නමුදු, ප්‍රධාන වශයෙන්ම තෙල් මිල ඉහල නැගීම හේතුවෙන් මේ වසරේදී වෙලඳ පරතරය එක්සත් ජනපද ඩොලර් මිලියන 274 සිට 2516 දක්වා ඉහල නැගින. පසු ගිය වසර තුල තෙල් ආනයනය සඳහා වැය වූ මුදල, 2004 දී වැය වූ එක්සත් ජනපද ඩොලර් බිලියන 1.2 ට සාපේක්ෂව ඩොලර් බිලියන 1.7ක් විය. 2006 වසර සඳහා ඇස්තමේන්තුගත තෙල් බිල ඩොලර් බිලියන 2.2කි.

සමස්ත ගෙවුම් ශේෂ අතිරික්තය සාධක දෙකක නිශ්පාදිතයකි. පලමුව රටේ ලාභ ශ්‍රම අපනයනයෙන් ලැබුනු ආදායම සහ දෙවනුව සුනාමි ආධාර ආගලනය. ශ්‍රම අපනයනයෙන් පසු ගිය වසරේදී ලැබුනු ආදායම එක්සත් ජනපද ඩොලර් 1.92ක් වන අතර ගිය වසරට සාපේක්ෂව එය සියයට 22.7ක වැඩි වීමකි. මින් අඩකටත් වැඩි මුදලක් උපයා ඇත්තේ මැද පෙරදිග කොන්ත්‍රාත් කම්කරුවන් විසිනි. වාර්තාවට අනුව, " සුනාමි සම්බන්ධිත සුවිසල් ආගලනයන් සමග 2005 වසරේදී ශුද්ධ ආගලනය සියයට 51 කින් වැඩිවීම සහ සුනාමියෙන් පසු නය ගෙවීම සඳහා කල් ලබා දීම හේතුවෙන් නය සේවා ගෙවීම් පහත වැටීම හේතු කොට ගෙන සමස්ත ගෙවුම් ශේෂ අතිරික්තය එක්සත් ජනපද ඩොලර් මිලියන 501ක් විය."

රට නය බරෙන් මිරිකී ඇත. මහ බැංකුවට අනුව නය ප්‍රමාන දල ජාතික නිෂ්පාදිතයෙන් සියයට 95කි. පසු ගිය වසරේ දී මෙම අගය වන සියයට 105 හා සසඳන කල ඉතා සුලු පහල වැටීමක් පෙන්නුම් කෙරේ. තම අයවැය පරතරය පියවා ගැනීමට දරන වියරු ප්‍රයත්නයේ දී ආන්ඩුව ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙලඳපොලෙන් තව දුරටත් නය ලබා ගැනීම සඳහා මාන බලමින් සිටී. එක්සත් ජනපද ඩොලර් මිලියන 500ක බැඳුම්කර ගෝලීය මූල්‍ය වෙලඳ පොලේ විකුනා මුදල් ලබා ගැනීමට කලින් තිබූ සැලසුම සංශෝධනය කොට එය ඩොලර් බිලියන 1 දක්වා වැඩි කල බැව් පසු ගිය පෙබරවාරියේදී නිවේදනය කලේ ය.

කෙසේ නමුදු, මහ බැංකු වාර්තාවේ ප්‍රධාන තෙරපුම යෙදෙන්නේ, විදේශ ආයෝජන ආකර්ශනය කරගනු වස් පුද්ගලීකරනය, රජයේ වියදම් කපා දැමීම හා මූල්‍යමය දිරිගැන්වීම් ඇතුලු ආර්ථික ප්‍රතිව්‍යුහකරනයේ තවත් වටයක් සඳහා ආන්ඩුව තල්ලු කිරීමට යි. ඉන්දියාවේ සහ චීනයේ දැවැන්ත ලාභ ශ්‍රම වේදිකාවක් සමග ශ්‍රී ලංකාව තරගයේ යෙදී සිටින බැව් වාර්තා පෙන්වා දෙයි. ඉහල ආර්ථික වර්ධනයක් සඳහා දුර්වල භෞතික හා සේවා යටිතල පහසුකම්බාධාවන් ලෙස

ක්‍රියාත්මක වන බැව් පෙන්වා දෙන එය "තීරනාත්මක ව්‍යුහමය ප්‍රතිසංස්කරන" වල අවශ්‍යතාව මතු කරයි.

"රාජ්‍ය අංශයේ භූමිකාව සහ එහි සීමාසහිත භාවයන් පිලිබඳව ද ලිබරලීකරනයේ සහ ප්‍රතිසංස්කරනයන්ගේ වාසි පිලිබඳව ද, පුද්ගලික අංශයේ භූමිකාව පිලිබඳව ද මහජනතාව දැනුවත් කිරීමේ විස්තීර්න වැඩ සටහනක්" වාර්තාවෙන් කැඳවුම් කෙරේ. එය ඉතා සුවිශේෂිතව, ඉන්ධන සහ පොහොර සහනාධාරයන් ද, ශුභ සාධන වැඩ සටහන්ද කප්පාදු කිරීමට තෝරා ගෙන ඇත.

මහ බැංකුවේ ආර්ථික පර්යේෂන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තේනුවර වාර්තාව පිලිබඳ සමුලුවකදී රමෙසේ පැවසී යඃ "දුප්පතුන් එල්ල කර ගත් අනවශ්‍ය සහනාධාරයන් මගින් අයවැය සම්පත් ඵලදායී ආයෝජනයන්ගෙන් ඉවතට ගෙන යනු ලබයි.... මිල ගනන් වැඩිවීමේ සමස්ත බලපෑම මහජනතාව වෙත යොමු කල හොත් ඔවුන් අධික ඉන්ධන මිල යටතේ ජීවත් වන්නේ කෙසේ දැයි ඉගෙන ගනු ඇත. (සහනාධාර ලබා නොදී) මිල ගනන් නිරවද්‍ය කල හොත් ඒ අනුව පරිභෝජනය සැකසෙනු ඇත."

මෙය, රටේ ආර්ථික අර්බුදයේ සමස්ත බර කම්කරු පන්තියේ හා ග්‍රාමීය දුප්පතුන්ගේ වඩාත්ම පීඩිත කොටස්වල කර මතට පැටවීමේ වට්ටෝරුවක් මිස වෙන අන් යමක් නොවේ. රාජපක්ෂ ආන්ඩුව දැනටමත් සහනාධාර විනාශ කරමින් සිටියි. මාර්තු මාසයේ දී, ඉන්ධන මිල සියයට දහයකටත් වඩා වැඩි කරන බැව් එය නිවේදනය කලේ ය. මෙම මිල වැඩි කිරීම සාධාරනය කිරීම සඳහා රාජපක්ෂගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නිවේදනයක් නිකුත් කරමින් කියා සිටියේ, තෙල් සහනාධාරය "ආන්ඩුවේ මුදල් පෙට්ටගමට දරා ගත නොහැකි බැවින් වැඩිමනත් කොටස මහජනතාව මතට පැටවූ" බවයි.

උද්ධමන වේගය සියයට 11.6ක්ව තිබියදී පවා, පුද්ගලික අංශයේ වැටුප් වැඩි කිරීම සඳහා බලපෑම් නොයොදන ලෙස මහ බැංකුව ආන්ඩුවට උපදෙස් දෙන්නේ, "මෙය ආර්ථිකයේ ඵලදායිතාව පදනම් කර ගත් වැටුප් සකස්කිරීමේ පිලිවෙතක් වර්ධනය කිරීම සමග නොගැලපෙන බව" පවසමිනි. වාර්තාව සටහන් කරන්නේ 2005 වර්ෂය තුල පුද්ගලික අංශයේ සැබෑ වැටුප් මට්ටම් සියයට 2.3 සිට 7.6 දක්වා පහත වැටුනු බවයි. ඒ සමග ම, දේශීය කර්මාන්තයේ සාමාන්‍ය ලාභය සියයට 2.1 සිට 14.4 දක්වා අගයකින් ඉහල නැගුනි.

වාර්තාව වක්‍ර ආකාරයකින් පෙන්වනු ලබන්නේ ශ්‍රී ලංකාවේ පාලක පන්තිය මුහුන දී සිටින නොවිසඳියහැකි පරස්පර විරෝධයන් ය. විදේශ ආයෝජනයන් සහ ලාභය ප්‍රවර්ධනය කිරීමට ආන්ඩුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහ ලෝක බැංකුවේ "ප්‍රතිසංස්කරන" ක්‍රියාවේ යොදවනු ලබයි. එය ජීවන කොන්දේසිවල බාදනයට තුඩු දෙන අතර ඉහල මට්ටමේ දරිද්‍රතාවක් සහ විරැකියාවක් නිර්මානය කරමින් දුප්පතුන් සහ පොහොසතුන් අතර ගැඹුරුවන බෙදීමක් ඇති කරයි. ඒ සමග ම, ආන්ඩුව වැඩෙන මහජන අතෘප්තියට සහ කෝපයට ප්‍රතිචාර ලෙසින් කම්කරු ජනතාව බෙදා වෙන් කිරීම සඳහා වාර්ගික වෛරයන් කලතනු ලබයි. එසේ කරන ගමන්ම, ආර්ථික අර්බුදය උග්‍ර කිරීම පමනක් සිදු කෙරෙන යුද්ධයක් දෙසට නැවත රට තල්ලු කරනු ලබයි.

© www.wsws.org